ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Press Notice No: HRC/P/i/S/14/05/25

## මාධ්‍ය නිවේදනය

**පාසල් සිසුවියක් සියදිවි හානිකර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිය මෙහෙයවීමෙන් සිදුකරන විමර්ශනය.**

කොටහේන මහල් නිවාස සංකීර්ණයේ සිසුවිය සියදිවි හානිකර ගැනීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිය මෙහෙයවීමෙන් විමර්ශනයක් ආරම්භ කළ අතර, එකී විමර්ශනය 2025-05-14 වන දින පෙ.ව.10.30ට මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලදී. බම්බලපිටිය රාමනාදන් හින්දු විද්‍යාලයේ විදුහල්පති, කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, සිද්ධියට සම්බන්ධ අදාළ ගුරුවරයා, පොලිස් ස්ථානාධිපති බම්බලපිටිය, පොලිස් ස්ථානාධිපති කොටහේන, හා අදාළ පුද්ගලික උපකාරක පන්ති සම්බන්ධීකාරක විමර්ශනය සඳහා කැඳවන ලදී.

විදුහල්පති හා අදාළ ගණිත ගුරුවරයා හේතු දැක්වීමකින් තොරව නියමිත වේලාවේදී කොමිෂන් සභාව හමුවේ පරීක්ෂණයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් ඔවුනට විරුද්ධව කොමිෂන් සභා පනත ප්‍රකාරව ක්‍රියා නොකිරීමට හේතු විමසීමට තීරණය කරන ලදී. බම්බලපිටිය සහ කොටහේන පොලිස් ස්ථානාධිපතිවරුන් විසින් සිද්ධියට අදාලව ගෙන ඇති ක්‍රියාමර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරන ලදී. කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවෙන් නියෝජ්‍ය කළාප අධ්‍යප අධ්‍යක්ෂ කරුණු ඉදිරිපත් කරන ලද අතර මේ සම්බන්ධයෙන් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ දින 07ක් ඇතුලත වැඩිදුර වාර්තාවක් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කිරීමට නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත දැනුම්දෙන ලද අතර දැනට පවතින විමර්ශන ප්‍රගතිය හා විමර්ශන සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස බම්බලපිටිය පොලීසියට හා කොටහේන පොලීසියට නියම කරන ලදී. අදාළ උපකාරක පන්ති සම්බන්ධීකාරක කොමිෂන් සභාවට පැමිණ සිද්ධියට අදාලව ප්‍රකාශයක් ලබා දුන් අතර බම්බලපිටිය රාමනාදන් විද්‍යාලයේ විදුහල්පතිවරයා 2025-05-15 වන දින කොමිෂන් සභාව හමුවේ පෙනී සිටීමට දැන්වීමටද තීරණය කරන ලදී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු අවසන් කර එහි නිගමන හා නිර්දේශ ලබා දීමට බලාපොරොත්තු වන අතර, මේ පිළිබඳව අදාල රාජ්‍ය ආයතන විසින් ඔවුන්ගේ සිය වගකීම නිසි පරිදි ඉටුකර තිබේද යන්න සහ යම්කිසි රාජ්‍ය පාර්ශවයක් අදාල දැරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබේද යන්න පිළිබදව හා ළමා හිංසනයක් සිදුවී තිබේද, එසේ සිදු වී තිබේ නම් කිනම් පාර්ශවයක් විසින් ඒ සඳහා වගකිව යුතුද යන්න පිළිබඳව සිය අවධානය යොමු කරනු ඇත.

ඉදිරියේදී මෙවැනි සිදුවීම් ඇති නොවීමට අධ්‍යාපන අමාත්‍යංශය ඇතුලු අනෙකුත් බළධාරී රාජ්‍ය ආයතන විසින් ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්ද මානව හිමිකම් කොමිෂන් සභාව අවධානයට ලක් කරනු ඇත.

නිහාල් චන්ද්‍රසිරි
මාධ්‍ය ප්‍රකාශක/අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ අංශය.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

14.05.2025

දුරකථන අංකය : 011 2505595
විද්‍යුත් තැපැල් ලිපිනය : rm.director.hrcsl@gmail.com